66440

AL/2020/21/S-I (NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

| | | |
|---|---|---|
| ආර්ථික විද්‍යාව I<br>பொருளியல் I<br>Economics I | 21 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්**
- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ※ උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** හෝ පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** නොමිල භාණ්ඩයක (free good) දක්නට ලැබෙන්නේ පහත දැක්වෙන කවර ලක්ෂණය ද?
(1) එම භාණ්ඩයට ඇති ඉල්ලුමට සාපේක්ෂව කිසියම් හිඟකමක් දක්නට ලැබේ.
(2) එම භාණ්ඩය සැපයීමේ ආවස්ථික පිරිවැයක් නොමැත.
(3) එම භාණ්ඩයේ පරිභෝජනය හෝ නිෂ්පාදනය හෝ කිසිදු බාහිරතාවක් ජනනය නොකරයි.
(4) එම භාණ්ඩය රජය විසින් ගාස්තුවක් අයකිරීමකින් තොරව සපයනු ලැබේ.
(5) එම භාණ්ඩයේ පරිභෝජනය සමාජයීය වශයෙන් හිතකර බැවින් එය රජය විසින්ම සපයනු ලැබේ.

**2.** ආර්ථික විද්‍යාඥයින් 'ප්‍රාග්ධනය' යන පදයෙන් සුවිශේෂ වශයෙන් අදහස් කරනුයේ
(1) වෙනත් භාණ්ඩ සහ සේවාවන් නිෂ්පාදනය කිරීම උදෙසා මිනිසා විසින් නිෂ්පාදනය කරන ලද භාණ්ඩයන් ය.
(2) ව්‍යාපාර වස්තු (stocks) සහ පිළිනපත් ස්වරූපයෙන් ප්‍රාග්ධනය මිලයට ගැනීමට යොදා ගනු ලැබූ මුදල් ය.
(3) ප්‍රාග්ධනය මිලයට ගැනීමේ අරමුණින් කුටුම්බ විසින් සමුච්චනය කරගනු ලැබූ ඉතුරුම් ය.
(4) ප්‍රාග්ධනය මිලයට ගැනීම සඳහා ව්‍යවසායකයෙක් විසින් භාවිත කරන ලද මුදල් ය.
(5) මූර්ත දේපල, වනාන්තර, ලෝහ සහ ඛනිජ සම්පත් ය.

**3.** 'සෑම ආර්ථික පද්ධතියක්ම හිඟකම පිළිබඳ ප්‍රශ්නයට මුහුණ දේ' යන ප්‍රකාශයෙන් කවරක් අදහස් වේ ද?
(1) සමාජයේ දක්නට ඇති ඇතැම් සම්පත්වල ප්‍රමාණයන් ඒවාට ඇති ඉල්ලුම ද ඉක්මවා යන බව ය.
(2) රටක ඛනිජ නිධි දක්නට ලැබෙනුයේ ඉතා නිශ්චිත ප්‍රමාණයකින් පමණක් බව ය.
(3) සම්පත් හිඟකම නිසා පූර්ණ සේවා නියුක්තිය අත්කර ගැනීමට රටවල් අසමත් වී සිටින බව ය.
(4) සමාජයේ සියලු වුවමනා සපුරාලීමට තරම් ඵලදායි සම්පත් ප්‍රමාණවත් නොවන බව ය.
(5) ආර්ථික පද්ධති වරින් වර චක්‍රීය ප්‍රසාරණ අවධිවලට මුහුණ දෙන අතර එවැනි අවස්ථාවල දී සම්පත් හිඟකම හටගන්නා බව ය.

**4.** නිෂ්පාදන හැකියා වක්‍රයක් මත සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතා ලක්ෂ්‍යය අත්කරගත හැකි වනුයේ
(1) අවම යෙදවුම් ප්‍රමාණයක් භාවිත කරමින් එක් එක් භාණ්ඩය නිෂ්පාදනය කරන විට දී ය.
(2) ආන්තික ප්‍රතිලාභ ආන්තික පිරිවැයට සමාන වන මට්ටමට එක් එක් භාණ්ඩය නිෂ්පාදනය කරන විට දී ය.
(3) පාරිභෝගික භාණ්ඩවලට සාපේක්ෂව ප්‍රාග්ධන භාණ්ඩ විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන විට දී ය.
(4) ප්‍රාග්ධන භාණ්ඩවලට සාපේක්ෂව පාරිභෝගික භාණ්ඩ විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන විට දී ය.
(5) භාණ්ඩයේ මිල ආන්තික ප්‍රතිලාභ ඉක්මවා යන මට්ටමේ දී එක් එක් භාණ්ඩය නිෂ්පාදනය කරන විට දී ය.

**5.** ඉල්ලුම් නීතිය මගින් ප්‍රකාශ කෙරෙනුයේ,
(1) භාණ්ඩයක මිල අඩුවීමක් එම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම් වක්‍රය වමට විතැන් කරන බව ය.
(2) අනිකුත් කරුණු නොවෙනස්ව තිබිය දී කිසියම් භාණ්ඩයක මිල ඉහළ යත්ම, එම භාණ්ඩයෙන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය පහළ යන බව ය.
(3) අනිකුත් කරුණු නොවෙනස්ව තිබිය දී කිසියම් භාණ්ඩයක මිල ඉහළ යත්ම, එම භාණ්ඩයෙන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ඉහළ යන බව ය.
(4) භාණ්ඩයක මිල අඩුවීමක් එම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් කරන බව ය.
(5) භාණ්ඩයක මිල ඉහළ යාමක් එම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම් වක්‍රය වමට විතැන් කරන බව ය.

Visit EDUHUB

[දෙවැනි පිටුව බලන්න.

**6.** කිසියම් භාණ්ඩයක් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය,
(1) යම්කිසි මිලක දී පාරිභෝගිකයන් විසින් මිල දී ගැනීමට සැලසුම් කරනු ලබන ප්‍රමාණයයි.
(2) එම භාණ්ඩයේ මිලෙන් සහ පාරිභෝගියාගේ ආදායම් මට්ටමෙන් ස්වාධීන වූවකි.
(3) පාරිභෝගිකයින්ගේ මිල දී ගැනීමේ සැලැසුම්වලින් ස්වාධීන වූවකි.
(4) සැමවිටම සමතුලිත ප්‍රමාණයට සමාන වේ.
(5) විවිධ මිලයන්හි දී පාරිභෝගිකයන් විසින් මිල දී ගැනීමට කැමති ප්‍රමාණයන් ය.

**7.** X භාණ්ඩයෙහි සැපයුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වීමට පහත සඳහන් කවරක් හේතු වේ ද?
(1) අනිකුත් කරුණු නොවෙනස්ව තිබිය දී X භාණ්ඩයෙහි මිල ඉහළ යාමක්
(2) X භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ දී අනුපූරක භාණ්ඩයක් ලෙස ක්‍රියා කරන Y භාණ්ඩයෙහි මිල ඉහළ යාමක්
(3) X භාණ්ඩය නිෂ්පාදනය කිරීමට භාවිත කෙරෙන තාක්ෂණයේ වැඩි දියුණු වීමක්
(4) X භාණ්ඩය නිෂ්පාදනය කිරීමට භාවිත කෙරෙන සම්පත්වල මිල පහළ බැසීමක්
(5) X භාණ්ඩය සඳහා වන ආදේශක භාණ්ඩයක ඉල්ලුමෙහි අඩු වීමක්

**8.** තරගකාරී වෙළෙඳපොළක ඉල්ලුම සහ සැපයුම යන දෙකම වැඩි වුවහොත්, සමතුලිත මිල සහ ප්‍රමාණය මත කෙබඳු බලපෑමක් හටගනී ද?
(1) නිශ්චිත වශයෙන්ම මිල ඉහළ යන නමුදු ප්‍රමාණය වැඩි වීමට හෝ අඩු වීමට හෝ නොවෙනස්ව තිබීමට හෝ පිළිවන.
(2) නිශ්චිත වශයෙන්ම ප්‍රමාණය ඉහළ යන නමුදු, මිල ඉහළ නැගීමට හෝ පහළ බැසීමට හෝ නොවෙනස්ව තිබීමට හෝ පිළිවන.
(3) නිශ්චිත වශයෙන්ම ප්‍රමාණය පහළ යන නමුදු, මිල ඉහළ නැගීමට හෝ පහළ බැසීමට හෝ නොවෙනස්ව තිබීමට හෝ පිළිවන.
(4) නිශ්චිත වශයෙන්ම මිල පහළ යන නමුදු, ප්‍රමාණය වැඩිවීමට හෝ අඩු වීමට හෝ නොවෙනස්ව තිබීමට හෝ පිළිවන.
(5) නිශ්චිත වශයෙන්ම මිල හා ප්‍රමාණය යන දෙකම ඉහළ නගී.

**9.** එක්තරා පාරිභෝගික භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම් ශ්‍රිතය $Q_D = 500 - 5P$ යයි සලකන්න. රුපියල් 20ත් රුපියල් 30ත් අතර මිල පරාසයේ දී මෙම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුමෙහි චාප මිල නම්‍යතාව කොපමණ වේ ද?
(1) $-0.25$ (2) $-0.33$ (3) $-0.43$ (4) $-0.52$ (5) $-0.66$

**10.** කිසියම් රටක ජාතික ආපදාවක් පවතින අවස්ථාවක, එරට එළවළු ගොවීහු තම ත්‍යාගශීලීත්වය පෙන්නුම් කරමින් පාරිභෝගිකයන්ට අවශ්‍යතරම් එළවළු, තරගකාරී සමතුලිත වෙළෙඳපොළ මිලෙන් හරි අඩකට අලෙවි කිරීමට තීරණය කරති. මෙම ක්‍රියාවේ ප්‍රතිඵලයක් වශයෙන්
(1) ආර්ථික අතිරික්තය පහළ වැටෙනු ඇත. (2) ආර්ථික අතිරික්තය ඉහළ නගිනු ඇත.
(3) ආර්ථික අතිරික්තය නොවෙනස්ව පවතිනු ඇත. (4) පාරිභෝගික අතිරික්තය පහළ වැටෙනු ඇත.
(5) නිෂ්පාදක අතිරික්තය ඉහළ නගිනු ඇත.

**11.** කිසියම් භාණ්ඩයක මිල වෙනස්වීමක ආදායම් ප්‍රතිවිපාකය ඍණ අගයක් ගනු ලැබුවත්, ආදේශන ප්‍රතිවිපාකය වඩා බලවත් වේ නම්, එම භාණ්ඩය
(1) ගිෆන් භාණ්ඩයක් වේ. (2) සාමාන්‍ය භාණ්ඩයක් වේ.
(3) අත්‍යවශ්‍ය භාණ්ඩයක් වේ. (4) බාල භාණ්ඩයක් වේ.
(5) සුඛෝපභෝගී භාණ්ඩයක් වේ.

**12.** කිසියම් වෙළෙඳපොළක උපරිම මිලක් පනවා ඇති විට,
(1) අඛණ්ඩ භාණ්ඩ හිඟයක් හටගනී.
(2) අඛණ්ඩ භාණ්ඩ අතිරික්තයක් හටගනී.
(3) භාණ්ඩය අලෙවිකරන්නන්ට වඩාත් වාසිදායක වේ.
(4) කිසිවෙකුටවත් වාසියක් ඇති නොවේ.
(5) ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයට වඩා සැපයුම් කරනු ලබන ප්‍රමාණය විශාල වේ.

**13.** ගොවිපොළ නිෂ්පාදිත මත සඵල අවම මිලයන් නියම කිරීම ආශ්‍රයෙන් පැන නැගෙන ප්‍රශ්නයක් **නොවනුයේ** පහත සඳහන් කවරක් ද?
(1) බරපතළ ආකාරයේ අධි සැපයුමක් වෙළෙඳපොළෙහි හටගැනීම
(2) කෘෂිකාර්මික නොවන බදු ගෙවන්නන් වෙතින් ගොවි ජනයා වෙත ආදායම සංක්‍රාම වීම
(3) රජය විසින් විශාල සහනාධාර ප්‍රමාණයක් ලබාදීම
(4) පාරිභෝගිකයන් ගෙවන මිල ඉහළ යාම
(5) කෘෂිකාර්මික භාණ්ඩ සඳහා කළු කඩ ඇති වීම

**14.** තරගකාරී වෙළෙඳපොළක අලෙවි කෙරෙන භාණ්ඩයක් සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් ශ්‍රිතය, $Q_D = 180 - 2P$ සමීකරණයෙන් දැක්වේ. වෙළෙඳපොළ සමතුලිත මිල රුපියල් 65ක් වේ නම්, පාරිභෝගික අතිරික්තයෙහි අගය

(1) රුපියල් 625 කි.
(2) රුපියල් 1 000 කි.
(3) රුපියල් 1 250 කි.
(4) රුපියල් 3 250 කි.
(5) රුපියල් 4 500 කි.

**15.** වැඩිවන පරිමාණානුකූල ඵල තාක්ෂණික ලක්ෂණයක් පිළිබිඹු කරන අතර, එහි දී ආයතනයේ නිමැවුම වැඩිවීමේ ප්‍රතිශතය,

(1) ආයතනය යෙදවුම් වැඩිකරන ප්‍රතිශතය ඉක්මවා යයි.
(2) ආයතනය යෙදවුම් වැඩිකරන ප්‍රතිශතයට වඩා අඩු ය.
(3) ආයතනය යෙදවුම් වැඩිකරන ප්‍රතිශතයට සමාන වේ.
(4) ආයතනය ස්ථාවර යෙදවුම් වැඩිකරන ප්‍රතිශතය ඉක්මවා යයි.
(5) ආයතනය ස්ථාවර යෙදවුම් වැඩිකරන ප්‍රතිශතයට වඩා අඩු ය.

**16.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය කවරක් ද?

(1) ආර්ථික ලාභය = ගිණුම්කරණ ලාභය
(2) ආර්ථික පිරිවැය = ප්‍රත්‍යක්ෂ (ඍජු) පිරිවැය + ආරෝපිත (ගම්‍ය) පිරිවැය
(3) ආර්ථික පිරිවැය = ප්‍රත්‍යක්ෂ (ඍජු) පිරිවැය – ආරෝපිත (ගම්‍ය) පිරිවැය
(4) ආවස්ථික පිරිවැය = ආර්ථික ලාභය
(5) ගිණුම්කරණ පිරිවැය = ආරෝපිත (ගම්‍ය) පිරිවැය

**17.** කතිපයාධිකාරී වෙළෙඳපොළක අවශ්‍යම ලක්ෂණයක් වනුයේ පහත සඳහන් කවරක් ද?

(1) වෙළෙඳපොළ අබාධ ප්‍රවේශය සහ අබාධ පිටවීම
(2) මහා පරිමාණ නිෂ්පාදකයන් අතළොස්සක් සිටීම
(3) කිට්ටු ආදේශක නොමැති භාණ්ඩයක් නිෂ්පාදනය කරන එක් නිෂ්පාදකයෙක් පමණක් සිටීම
(4) සමජාතීය නිෂ්පාදිතයක් තිබීම
(5) ආයතන අතර රහසිගත එකඟතාවක් සඳහා අවස්ථා නොමැතිවීම

**18.** ආයතනයක් තම නිෂ්පාදිතය සඳහා පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයකට මුහුණ දෙනු ලැබේ නම්,

(1) එම ආයතනය මිල ගනුවෙක් නොවේ.
(2) අලෙවිය වැඩි කරගැනීම සඳහා මිල පහළ හෙළීමට හැකියාවක් ආයතනයට ඇත.
(3) මුළු අයභාරය වැඩි කරගැනීම සඳහා මිල ඉහළ දැමීමට හැකියාවක් ආයතනයට ඇත.
(4) ආයතනයේ ආන්තික අයභාර වක්‍රය වෙළෙඳපොළ මිලේ දී තිරස් රේඛාවක් වේ.
(5) ආයතනය සැමවිට ම ශුන්‍ය ආර්ථික ලාභ උපයයි.

**19.** නිමැවුමේ දළ වටිනාකම (GVO) සහ දළ එකතු කළ අගය (GVA) අතර වෙනස වනුයේ

(1) ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනයයි.
(2) අතරමැදි පරිභෝජනයයි.
(3) ශුද්ධ වක්‍ර බදු ය.
(4) ශුද්ධ ප්‍රාථමික ආදායම ය.
(5) ප්‍රාථමික යෙදවුම් ය.

**20.** ජාතික ගිණුම්කරණයේ දී පහත සඳහන් ක්‍රියාකාරකම් අතුරින් කවරක් නිෂ්පාදන ඉමෙන් බැහැර කෙරේ ද?

(1) බලපත්‍ර රහිත වෛද්‍ය වෘත්තිකයන්ගේ සේවා
(2) අයිතිකරුවාම පදිංචි නිවාසවලින් ලැබෙන සේවා
(3) කුටුම්බ විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ
(4) ගාස්තු අයකිරීමකින් තොරව රජය විසින් අධ්‍යාපනය සැපයීම
(5) කුටුම්බ සාමාජිකයන් විසින් රෝගී සහ වියපත් වූවන් රැකබලා ගැනීම

**21.** ප්‍රාථමික ආදායමෙහි ප්‍රධාන සංරචක වනුයේ,

(1) සේවක ගෙවීම්, දළ මෙහෙයුම් අතිරික්තය සහ නිෂ්පාදනය සහ ආනයන මත ශුද්ධ බදු ය.
(2) සේවක ගෙවීම්, මෙහෙයුම් අතිරික්තය සහ නිෂ්පාදනය මත වෙනත් ශුද්ධ බදු ය.
(3) සේවක ගෙවීම්, දළ මෙහෙයුම් අතිරික්තය සහ මිශ්‍ර ආදායම් ය.
(4) සේවක ගෙවීම්, මෙහෙයුම් අතිරික්තය සහ ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය ය.
(5) සේවක ගෙවීම්, දළ මෙහෙයුම් අතිරික්තය සහ නිෂ්පාදනය මත වෙනත් ශුද්ධ බදු ය.

**22.** කිසියම් වර්ෂයක පෞද්ගලික ආදායම, ජාතික ආදායම ඉක්මවූයේ නම් එමගින් නිගමනය කළ හැක්කේ,

(1) සංක්‍රාම ගෙවීම්වල ප්‍රමාණය, සමාජ ආරක්ෂණ දායක මුදල්, සමාගමික ආදායම් බදු සහ නොබෙදූ සමාගමික ලාභවල මුළු එකතුව ඉක්මවා ඇති බව ය.


(2) සමාජ ආරක්ෂණ දායක මුදල්, සමාගමික ආදායම් බදු සහ නොබෙදූ සමාගමික ලාභවල මුළු එකතුව, සංක්‍රාම ගෙවීම් ඉක්මවා ඇති බව ය.

(3) සමාජ ආරක්ෂණ දායක මුදල් සහ සමාගමික ආදායම් බදුවල එකතුව වක්‍ර බදු ඉක්මවා ඇති බව ය.

(4) සමාජ ආරක්ෂණ දායක මුදල්, සමාගමික ආදායම් බදු සහ වක්‍ර බදුවල එකතුව සංක්‍රාම ගෙවීම්වල ප්‍රමාණය ඉක්මවා ඇති බව ය.

(5) සමාගමික ආදායම් බදු සහ වක්‍ර බදුවල එකතුව සංක්‍රාම ගෙවීම් සහ නොබෙදූ ලාභවල එකතුව ඉක්මවා ඇති බව ය.

**23.** එක්තරා කල්පිත ආර්ථිකයක සමාහාර වියදම් (E) ශ්‍රිතය පහත රූපසටහන මගින් පෙන්නුම් කෙරේ.




මූර්ත නිමැවුම් මට්ටම රුපියල් බිලියන 600 දී

(1) සැලසුම් නොකළ තොග සමුච්චය රුපියල් බිලියන 200 කි.

(2) සැලසුම් නොකළ තොග පහළ වැටීම රුපියල් බිලියන 200 කි.

(3) සැලසුම් නොකළ තොග සමුච්චය රුපියල් බිලියන 150 කි.

(4) සැලසුම් නොකළ තොග පහළ වැටීම රුපියල් බිලියන 150 කි.

(5) ආර්ථිකයේ සාර්ව ආර්ථික සමතුලිතයක් පවතී.

**24.** ධන නිමැවුම් පරතරයක් පවත්නා ආර්ථිකයක

(1) උපයෝජනය නොකළ නිෂ්පාදන ධාරිතාවක් පවතී.

(2) චක්‍රීය සේවා වියුක්තියක් පවතී.

(3) සැබෑ නිමැවුම විභව නිමැවුමට වඩා අඩු ය.

(4) ආර්ථික කටයුතුවල වේගයෙහි පසුබැසීමක් දක්නට ඇත.

(5) ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනීය පීඩන දක්නට ලැබේ.

**25.** ආර්ථිකයක සමාහාර ඉතුරුම් ශ්‍රිතය $S = -200 + 0.25Y$ වේ නම්, මෙම ආර්ථිකයේ සමාහාර පරිභෝජන ශ්‍රිතය වනුයේ,

(1) $C = -200 + 0.75Y$

(2) $C = 200 - 0.25Y$

(3) $C = 200 + 0.25Y$

(4) $C = -200 - 0.75Y$

(5) $C = 200 + 0.75Y$

**26.** කල්පිත ආර්ථිකයක මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රුපියල් ට්‍රිලියන 80ක් ද, නාමික දළ දේශීය නිෂ්පාදිතය රුපියල් ට්‍රිලියන 240ක් සහ පොදු මිල මට්ටම 3ක් ද වේ යයි සලකන්න. මෙම ආර්ථිකයේ මුදල් සැපයුම රුපියල් ට්‍රිලියන 30ක් වේ නම්, මුදලේ සංසරණ ප්‍රවේගය

(1) 8 කි. (2) 10 කි. (3) 30 කි. (4) 80 කි. (5) 90 කි.

**27.** බැංකු පද්ධතිය තුළ එක් වාණිජ බැංකුවක් සතුව රුපියල් මිලියන 400ක අධි සංචිත පවතින බවත්, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 20%ක් බවත් උපකල්පනය කරමු. ඒ අතර, එම බැංකුවෙහි එක්තරා ගනුදෙනුකරුවෙක් රුපියල් මිලියන 25ක් තම ජංගම ගිණුමෙහි තැන්පත් කරන අතර බැංකුව තවත් ගනුදෙනුකරුවකුට රුපියල් මිලියන 120ක ණය මුදලක් ද ලබා දෙයි. දැන් මෙම බැංකුවට කොපමණ ප්‍රමාණයක් අතිරේක ණය ලබාදිය හැකි ද?

(1) රුපියල් මිලියන 2 125

(2) රුපියල් මිලියන 2 005

(3) රුපියල් මිලියන 425

(4) රුපියල් මිලියන 305

(5) රුපියල් මිලියන 300

Visit EDUHUB

[පස්වැනි පිටුව බලන්න.

**28.** වර්තමානයේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු කවරේ ද?
(1) මිල ස්ථායිතාව සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව
(2) මිල ස්ථායිතාව සහ පූර්ණසේවා නියුක්තිය
(3) මිල ස්ථායිතාව සහ තිරසාර සංවර්ධනය
(4) පූර්ණසේවා නියුක්තිය සහ ආදායම් ව්‍යාප්තියේ වඩා සමානතාවක් ඇතිකර ගැනීම
(5) මිල ස්ථායිතාව සහ රාජ්‍ය ණය බර අඩුකර ගැනීම

**29.** ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව 10%ක් බවත් මහ බැංකුව වාණිජ බැංකු වෙතින් රුපියල් මිලියන 300ක විවට වෙළෙඳපොළ මිල දී ගැනීම් සිදුකරන බවත් සලකන්න. මෙම මිල දී ගැනීම නිසා මුදල් සැපයුමෙහි සිදුවිය හැකි උපරිම වෙනස්වීම කොපමණ වේ ද?
(1) රුපියල් මිලියන 300කින් වැඩිවීම
(2) රුපියල් මිලියන 300කින් අඩුවීම
(3) රුපියල් මිලියන 3 000කින් වැඩිවීම
(4) රුපියල් මිලියන 3 000කින් අඩුවීම
(5) රුපියල් මිලියන 2 700කින් අඩුවීම

**30.** මූල්‍ය ප්‍රතිපත්තිය සමාහාර ඉල්ලුමට බලපානුයේ
(1) සෘජු සහ වක්‍ර බදු ආදායම් ලැබීම් වෙනස් කිරීම් මගිනි.
(2) කොටස් මිල ගණන්වල වෙනස් කිරීම් මගිනි.
(3) අපනයන ඉල්ලුමෙහි වෙනස් කිරීම් මගිනි.
(4) පරිභෝජන හා ආයෝජන වියදම් වෙනස් කිරීම මගිනි.
(5) ආණ්ඩුවේ වියදම් වෙනස් කිරීම මගිනි.

**31.** නිදහස් වෙළෙඳපොළක් තුළ බාහිරතාවක් පවතින විට,
(1) සමතුලිත මිල කෘත්‍රිම වශයෙන් ඉහළ මට්ටමක තීරණය වේ.
(2) සමතුලිත මිල කෘත්‍රිම වශයෙන් පහළ මට්ටමක තීරණය වේ.
(3) වෙළෙඳපොළට සමතුලිතය කරා ළඟාවීමට නොහැකි වේ.
(4) වෙළෙඳපොළ සමතුලිතය සමාජයීය වශයෙන් ප්‍රශස්ත සම්පත් බෙදීයාමක් තහවුරු නොකරයි.
(5) එම භාණ්ඩය පරිභෝජනය කරන පාරිභෝගිකයෝ නඩත්තු සහ රක්ෂණ සඳහා අතිරේක පිරිවැයක් දරති.

**32.** පොදු භාණ්ඩ නිෂ්පාදනය කිරීමට වෙළෙඳපොළ අසමත් වන්නේ,
(1) එබඳු භාණ්ඩ සඳහා ඉල්ලුමක් නොමැති බැවිනි.
(2) එබඳු භාණ්ඩයක් පරිභෝජනය කරන පාරිභෝගිකයන්ගෙන් මිලක් අයකර ගැනීමට නිෂ්පාදකයාට නොහැකි වන බැවිනි.
(3) සාමාන්‍යයෙන් එබඳු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ දී විශාල බාහිර පිරිවැයක් හටගන්නා බැවින් සහ පාරිභෝජනයේ දී බාහිර ප්‍රතිලාභ ජනනය කරන බැවිනි.
(4) එබඳු භාණ්ඩ නිෂ්පාදනය ආදායම් අසමානතා වැඩිවීමට හේතුවන බැවිනි.
(5) සාමාන්‍යයෙන් රාජ්‍ය අංශයට වඩා පෞද්ගලික ආයතනවල නිෂ්පාදන පිරිවැය අධික බැවිනි.

**33.** ශ්‍රී ලංකා රජයේ පුනරාවර්තන වියදමෙහි ප්‍රධාන සංරචක වනුයේ
(1) පොලී ගෙවීම්, මූර්ත වත්කම් අත්කර ගැනීම, වැටුප් හා වේතන සහ කුටුම්බ සඳහා පැවරුම් ය.
(2) පොලී ගෙවීම්, වැටුප් හා වේතන, රාජ්‍ය සංස්ථා සඳහා ප්‍රාග්ධන පැවරුම් සහ විශ්‍රාම වැටුප් ගෙවීම් ය.
(3) පොලී ගෙවීම්, වැටුප් හා වේතන, කුටුම්බ සඳහා වර්තන පැවරුම් සහ රාජ්‍ය සංස්ථා සඳහා වර්තන පැවරුම් ය.
(4) පොලී ගෙවීම්, වැටුප් හා වේතන, ණය ආපසු ගෙවීම් සහ කුටුම්බ සඳහා වර්තන පැවරුම් ය.
(5) පොලී ගෙවීම්, වැටුප් හා වේතන, මූල්‍ය වත්කම් අත්කර ගැනීම සහ පොහොර සහනාධාරය ය.

**34.** ප්‍රතික්‍රමික ආදායම් බද්දක් යටතේ දිළිඳු ජන කොටස්,
(1) ධනවත් අයට වඩා තම ආදායමෙන් අඩු ප්‍රතිශතයක් බදු වශයෙන් ගෙවති.
(2) ධනවත් අයට වඩා විශාල රුපියල් ප්‍රමාණයක් බදු වශයෙන් ගෙවති.
(3) තම ආදායමෙන් සමානුපාතිකව වෙනස්වන ප්‍රමාණයක් බදු වශයෙන් ගෙවති.
(4) ධනවත් අයට වඩා තම ආදායමෙන් ඉහළ ප්‍රතිශතයක් බදු වශයෙන් ගෙවති.
(5) බදු අයභාරය යොදා ගනිමින් අත්‍යවශ්‍ය භාණ්ඩ මිලයට ගැනීමට සමත්වෙති.

**35.** වර්තමානයේ ශ්‍රී ලංකා මධ්‍යම රජයේ ප්‍රධානතම අයභාර මූලාශ්‍රය වනුයේ
(1) ආදායම් බදු ය.
(2) නිෂ්පාදනය හා වියදම මත බදු ය.
(3) ලාභ, ලාභාංශ හා පොලී ආදායම් ය.
(4) වෙළෙඳ ව්‍යවසායන්ගේ දළ ඉපැයීම් ය.
(5) ලොතරැයි අයභාරයයි.

Visit EDUHUB

**36.** සාපේක්ෂ වාසි මූලධර්මයට අනුව ලෝක නිෂ්පාදන සහ පරිභෝජන මට්ටම් ඉහළම අගයක් ගනුයේ, පහත සඳහන් කවර කරුණක් සැබෑවන ලෙස රටවල් විසින් භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන විට දී ද?
(1) ආවස්ථික පිරිවැය පහළම අගයක් ගනු ලබන විට
(2) නිරපේක්ෂ වාසි ඉහළම අගයක් ගනු ලබන විට
(3) වෙළෙඳ ශේෂය අතිරික්තයක් පෙන්නුම් කරන විට
(4) විනිමය අනුපාතිකය පහළ බසිමින් පවතින විට
(5) ප්‍රවාහන පිරිවැය බොහෝ සෙයින් ශූන්‍ය අගයකට ආසන්න වන විට

**37.** A රටෙහි රෙදි ඒකකයක් නිපදවීමට ශ්‍රම පැය 5ක් ද සහල් ඒකකයක් නිපදවීමට ශ්‍රම පැය 10ක් ද වැය වේ. B රටෙහි රෙදි ඒකකයක් නිපදවීමට ශ්‍රම පැය 7ක් ද සහල් ඒකකයක් නිපදවීමට ශ්‍රම පැය 21ක් ද වැය වේ. එක් එක් රටෙහි සාපේක්ෂ වාසි පදනම්කර ගනිමින් විශේෂ ප්‍රාගුණ්‍යනය කිරීමට දෙරටම තීරණය කරනු ලැබුහොත්, A රට B රට සමග භාණ්ඩ හුවමාරු කිරීමට කැමති වනුයේ කවර හුවමාරු අනුපාතිකයක් යටතේ ද?
(1) සහල් ඒකකයක් සඳහා රෙදි ඒකක 2කට වඩා වැඩි ප්‍රමාණයක්
(2) රෙදි ඒකකයක් සඳහා සහල් ඒකක 2කට වඩා වැඩි ප්‍රමාණයක්
(3) සහල් ඒකකයක් සඳහා රෙදි ඒකක 3කට වඩා වැඩි ප්‍රමාණයක්
(4) රෙදි ඒකකයක් සඳහා සහල් ඒකක 3කට වඩා වැඩි ප්‍රමාණයක්
(5) රෙදි ඒකකයක් සඳහා සහල් ඒකක 0.5කට වඩා වැඩි ප්‍රමාණයක්

**38.** ආරක්ෂණවාදය සාධාරණය කරනු පිණිස බොහෝදුරට යොදා ගැනීමට හැකියාවක් ඇත්තේ පහත දැක්වෙන කවර තර්ක **දෙකක්** ද?
A - ඉහළ පිරිවැය සහිත දේශීය කර්මාන්ත රැකගැනීම
B - උපායමාර්ගික වැදගත්කමක් ඇති කර්මාන්ත රැකගැනීම
C - ළදරු කර්මාන්ත රැකගැනීම
D - පාරිසරික ප්‍රමිතීන් ආරක්ෂාකර ගැනීම
E - රජයේ අයභාරය උපරිමකර ගැනීම
(1) A සහ D (2) B සහ C (3) B සහ D (4) C සහ D (5) D සහ E


**39.** විදේශීය සෘජු ආයෝජන ලැබීමක් වාර්තා කෙරෙනුයේ ගෙවුම් ශේෂයේ කවර ගිණුමක ද?
(1) ප්‍රාථමික ආදායම් ගිණුම (2) ද්විතීයික ආදායම් ගිණුම (3) ප්‍රාග්ධන ගිණුම
(4) ජංගම ගිණුම (5) මූල්‍ය ගිණුම

**40.** පාවෙන විනිමය අනුපාතික යන්නෙන් අදහස් කෙරෙනුයේ,
(1) කම්පනයන් මගින් විදේශ විනිමය වෙළෙඳපොළ තුළ ඇතිවන අස්ථායිතාවන් යළි හැඩගැස්වීමට අසමත් විනිමය අනුපාතිකයන් ය.
(2) විනිමය වෙළෙඳපොළට මැදිහත්වීම් ඔස්සේ රජය විසින් පවත්වාගෙන යනු ලබන විනිමය අනුපාතිකයන් ය.
(3) කිසියම් රටක ව්‍යවහාර මුදල් සඳහා ඇති ඉල්ලුම හා සැපයුම මත තීරණය වන විනිමය අනුපාතිකයන් ය.
(4) රටක ව්‍යවහාර මුදල සඳහා අධි ඉල්ලුමක් ඇති විටක, එම මුදල් ඒකකය අවප්‍රමාණය කිරීමට සිදුවන තත්ත්වයකි.
(5) රටක ව්‍යවහාර මුදල්වල අධි සැපයුම් තත්ත්වයක් ඇති විටක, එම මුදල් ඒකකයේ අගය ඉහළ යාමට තුඩුදෙන තත්ත්වයකි.

**41.** ගෙවුම් ශේෂ සහ විදේශ විනිමය සංචිත පිළිබඳ ප්‍රශ්නවලට මුහුණ පා සිටින රටවලට උදව් කිරීම සඳහා පිහිටුවා ගනු ලැබූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) ඒ සඳහා යෝජනා කරන ලද විසඳුම වූයේ,
(1) එම රටේ ව්‍යවහාර මුදල ප්‍රතිප්‍රමාණය කිරීම ය.
(2) ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගිවිසුම් ඔස්සේ එම රටට විදේශ විනිමය සංචිත ණයට ලබා දීම ය.
(3) එම රටේ විනිමය අනුපාතිකය ඉහළ අගයක නැවත පිහිටුවා ගැනීම සඳහා උදව් කිරීම ය.
(4) එම රට සතු විදේශීය වත්කම් මිල දී ගෙන ඒවා විදේශ ව්‍යවහාර මුදල්වලට පරිවර්තනය කොට දීම ය.
(5) එම රටෙහි අපනයන සඳහා අලුත් වෙළෙඳපොළවල් සොයා ගැනීමට උදව් කිරීම ය.

Visit EDUHUB

**42.** පහත දැක්වෙන රූපසටහන ශ්‍රී ලංකා රුපියලේ අගය එක්සත් ජනපද ඩොලර්වලින් පෙන්නුම් කරයි.




ශ්‍රී ලංකා රුපියල් සඳහා ඉල්ලුම $D_1$ සිට $D_2$ දක්වා විතැන් වුවහොත් ඇතිවිය හැකි ප්‍රතිවිපාකය කවරේ ද?
(1) ඇමෙරිකා එක්සත් ජනපදයට යවනු ලබන ශ්‍රී ලංකා අපනයනවල මිල වඩාත් අධික වනු ඇත.
(2) ශ්‍රී ලාංකික සංචාරකයනට ඇමෙරිකා එක්සත් ජනපදයේ සංචාරය කිරීම ලාභදායක වනු ඇත.
(3) ඇමෙරිකානු ආයෝජකයනට ශ්‍රී ලංකාවේ භාණ්ඩාගාර පිළිනපත් වඩාත් ලාභදායක වනු ඇත.
(4) ඇමෙරිකානු ආයෝජකයනට ශ්‍රී ලංකාවේ භාණ්ඩාගාර පිළිනපත් වඩා මිල අධික වනු ඇත.
(5) ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ගෙන්වනු ලබන ආනයනවල පිරිවැය පහළ වැටෙනු ඇත.

**43.** ආර්ථික සංවර්ධනය යන්නෙන් අදහස් වනුයේ
(1) ගෙවුම් ශේෂ අතිරික්තයක් සහිතව ආර්ථික වෘද්ධියක් හටගැනීම ය.
(2) ආර්ථික වෘද්ධියත් සමගම ව්‍යුහාත්මක සහ ගුණාත්මක වෙනස්කම් සිදුවීම ය.
(3) නාගරික ජනගහනයේ ජීවන තත්ත්වය උසස් වීම ය.
(4) දළ ජාතික ආදායමේ (GNI) තිරසාර ඉහළ යාමක් ඇති වීම ය.
(5) සාධාරණ ආදායම් ව්‍යාප්තියක් සමගම දරිද්‍රතා මට්ටම පහළ වැටීම ය.

**44.** තිරසාර සංවර්ධනයක් යන්නෙන් හැඟැවෙනුයේ
(1) එහි ප්‍රතිඵල වශයෙන් අනාගතයේ පාරිසරික හායනයක් ඇතිවුවත්, වර්තමානයේ ආර්ථික හා සමාජයීය ශක්‍යතාව ලබාදෙන සංවර්ධනයකි.
(2) එහි ප්‍රතිඵලයක් වශයෙන් අනාගත පරම්පරාවන් සඳහා ආර්ථික හා සමාජයීය හායනයක් ඇතිවුවත්, වර්තමානයේ පාරිසරික තිරසාරභාවය ලබාදෙන සංවර්ධනයකි.
(3) අනාගත පරම්පරාවන්ට තම අවශ්‍යතා සපුරාගැනීමට ඇති හැකියාව කැප නොකොට, වර්තමාන අවශ්‍යතා සපුරාලනු ලබන සංවර්ධනයකි.
(4) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ තිරසාර වැඩිවීමක් සහිතව ස්වභාවික සම්පත් සම්පූර්ණයෙන්ම උපයෝජනය කිරීමකි.
(5) එමගින් වර්තමාන සමාජයේ අවශ්‍යතා සපුරාගත නොහැකි වුවද අනාගත පරම්පරාවනට තම අවශ්‍යතා සපුරාගත හැකි වන සංවර්ධනයකි.

**45.** 'නිරපේක්ෂ' දරිද්‍රතා රේඛාව මගින් පෙන්නුම් කරනුයේ
(1) සමාජයේ දක්නට ලැබෙන අන්ත දරිද්‍රතා මට්ටම ය.
(2) ජීවිතය පවත්වාගෙන යාමට අවශ්‍යවෙතැයි ඇස්තමේන්තු කළ අවම ආදායම් මට්ටම ය.
(3) ඔවුනොවුන්ගේ සංස්කෘතික ප්‍රතිමාන හා සාරධර්මවලට සාපේක්ෂව දිළින්දන් ලෙස ගැනෙන පවුල් ඒකක ප්‍රමාණයයි.
(4) නගරයක් තුළ දිළිඳු ජනතාව සංකේන්ද්‍රණය වී සිටින ප්‍රදේශයන් ය.
(5) ජනගහනයෙන් පහළම ආදායම උපයන 10% හිමිකරගත් සාමාන්‍ය මාසික ආදායම ය.

**46.** පහත සඳහන් කවරක් මැනීමට ලෝරන්ස් වක්‍රය යොදා ගැනේ ද?
(1) විවිධ රටවල ධනය සහ ආදායම අතර අනුපාතය
(2) විවිධ රටවල පොදු භාණ්ඩ සහ පෞද්ගලික භාණ්ඩ අතර අනුපාතය
(3) විවිධ රටවල ආදායම් සමානතාව සහ ආදායම් අසමානතාව අතර අනුපාතය
(4) කිසියම් රටක ඉහළම ආදායම් ලබන ප්‍රතිශතය සහ පහළම ආදායම ලබන ප්‍රතිශතය අතර අනුපාතය
(5) වැඩකරන වයසේ ජනගහනය සහ වැඩ නොකරන වයසේ ජනගහනය අතර අනුපාතය


Visit EDUHUB

**47.** කම්කරුවකුගේ ආන්තික ඵලදාව ශුන්‍යය හෝ ශුන්‍යයට ආසන්නව හෝ පවතිනුයේ කවර විරැකියා තත්ත්වයක් යටතේ ද?
(1) සැඟැවුණු සේවා වියුක්තිය (2) අනිච්ඡානුගත සේවා වියුක්තිය
(3) වාරික සේවා වියුක්තිය (4) ව්‍යුහාත්මක සේවා වියුක්තිය
(5) සාර්ශික සේවා වියුක්තිය

**48.** ලෝක බැංකුවේ 'ව්‍යාපාර කරගෙන යාමේ පහසුව' පිළිබඳ දර්ශක (Ease of Doing Business Indicators)
(1) සත්කාරක රටවල් වශයෙන් ලබාගත් විදේශ ඍජු ආයෝජන ප්‍රමාණ මත රටවල් පෙළගස්වයි.
(2) ආයෝජන ප්‍රභවස්ථාන රටවල් වශයෙන් තමන් ආයෝජනය කොට ඇති විදේශ ඍජු ආයෝජන මත රටවල් පෙළගස්වයි.
(3) ඒ ඒ රටවල් සතු සාපේක්ෂ වාසි මත කර්මාන්ත පෙළගස්වයි.
(4) බොහෝ රටවල ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට ඇති පහසුව මිනුම් කරයි.
(5) දිළිඳු රටවල ආයෝජනය කිරීම් අධෛර්යමත් කෙරෙන බැවින් ආර්ථික සංවර්ධනයට බාධකයක් වේ.

**49.** 2018 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය නිවැරදිව දැක්වෙනුයේ කුමන කාණ්ඩය මගින් ද?

| | කෘෂිකර්මය, වනාන්තර සහ ධීවර | කර්මාන්ත | සේවා |
|---|---|---|---|
| (1) | 7.0 | 26.1 | 57.7 |
| (2) | 7.6 | 25.8 | 60.4 |
| (3) | 8.2 | 24.0 | 60.1 |
| (4) | 8.9 | 27.8 | 64.4 |
| (5) | 10.2 | 24.5 | 60.2 |

**50.** 2018 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය ඍජු ආයෝජන සඳහා ඉතාම ඉහළ දායකත්වය සැපයූ රටවල් හතර වූයේ
(1) චීනය, හොංකොං, ඉන්දියාව සහ මැලේසියාවයි.
(2) චීනය, සිංගප්පූරුව, ජපානය සහ ස්විට්සර්ලන්තයයි.
(3) චීනය, ඉන්දියාව, ජපානය සහ නෝර්වේ ය.
(4) චීනය, කැනඩාව, ඉතාලිය සහ ඇමෙරිකා එක්සත් ජනපදයයි.
(5) චීනය, ඉන්දියාව, මැලේසියාව සහ ජර්මනියයි.

* * *

Visit EDUHUB

66440

AL/2020/21/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ආර්ථික විද්‍යාව II
பொருளியல் II
Economics II

21 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**

* 'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

## 'අ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

**1.** (i) හිඟකම යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද? නිෂ්පාදන හැකියා වක්‍රයක් යොදා ගනිමින් හිඟකම පිළිබඳ ප්‍රශ්නය පැහැදිලි කරන්න. (ලකුණු 03යි)

(ii) නිෂ්පාදන අකාර්යක්ෂමතාව සහ සම්පත් බෙදා වෙන්කිරීමේ අකාර්යක්ෂමතාව, සම්පත් උපයෝජනයේ නාස්තියක් ලෙස සැලකෙන්නේ ඇයි? (ලකුණු 04යි)

(iii) ආර්ථික පද්ධතියක ප්‍රධාන කාර්යයන් කවරේ ද? (ලකුණු 03යි)

(iv) කෝවිඩ් -19 වැනි වසංගත තත්ත්වයක් නිසා රටක නිෂ්පාදන ධාරිතාවට කුමක් සිදුවනු ඇද්දැයි නිෂ්පාදන හැකියා වක්‍රයක් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(v) ශ්‍රමික විභාජනය ආර්ථිකයක නිෂ්පාදන මට්ටමෙහි ඉහළ යාම් සඳහා හේතුවන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

**2.** (i) භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම සහ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අතර වෙනස කුමක් ද? රූපසටහනක එම වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04යි)

(ii) ආදායම් ඉල්ලුම් නම්‍යතා සංකල්පය යොදා ගනිමින් සාමාන්‍ය භාණ්ඩ, බාල භාණ්ඩ සහ සුඛෝපභෝගී භාණ්ඩ නිර්වචනය කරන්න. (ලකුණු 03යි)

(iii) ආර්ථිකයක භාණ්ඩ බෙදාවෙන්කර හැරීම සඳහා යොදා ගනු ලබන මිල නොවන සළාකන ක්‍රම **තුනක්** නම් කරන්න. (ලකුණු 03යි)

(iv) එක්තරා කුඩා නගරයක ඇති පාන් වෙළෙඳපොළක් පහත සඳහන් ඉල්ලුම් හා සැපයුම් සමීකරණ මගින් නිරූපණය කෙරේ.

$Q_D = 110 - P$ (ඉල්ලුම) $Q_S = -40 + 2P$ (සැපයුම)

(a) මෙම වෙළෙඳපොළෙහි සමතුලිත මිල සහ ප්‍රමාණය සොයන්න. (ලකුණු 02යි)

(b) සමතුලිතයේ දී සමස්ත අතිරික්තයේ ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 04යි)

(c) රුපියල් 60 දී පාන් ඉල්ලුමෙහි මිල නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 04යි)

Visit EDUHUB

[දෙවැනි පිටුව බලන්න

**3.** (i) 'උපරිම මිල' සහ 'අවම මිල' අතර වෙනස දක්වන්න. (ලකුණු 04යි)

(ii) උපරිම මිලක් නිසා කිසියම් භාණ්ඩයක් සඳහා අධි ඉල්ලුමක් ඇති වන්නේ ඇයි? රූපසටහනක් යොදා ගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) නිෂ්පාදක සහනාධාරයක් නිසා ශුභ සාධනය අහිමි වී යාමක් හට ගන්නේ ඇයි? යෝග්‍ය රූපසටහනක් යොදා ගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iv) තරගකාරී වෙළෙඳපොළක ඉල්ලුම් ශ්‍රිතය, $Q_D = 180 - 2P$ සමීකරණයෙන් ද, සැපයුම් ශ්‍රිතය $Q_S = -15 + P$ සමීකරණයෙන් ද දැක්වේ. මෙම වෙළෙඳපොළෙහි භාණ්ඩ ඒකකයක් රුපියල් 72ක් ලෙස අවම මිලක් නියම කරනු ලැබුවහොත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් අහිමිවන ශුභ සාධනයේ ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 08යි)

**4.** (i) නිෂ්පාදන ශ්‍රිතයක් යනු කුමක් ද? කෙටි කාලීන සහ දිගු කාලීන නිෂ්පාදන ශ්‍රිත අතර වෙනස දක්වන්න. (ලකුණු 03යි)

(ii) ආර්ථික පිරිමැසුම් සහ ආර්ථික නොපිරිමැසුම් හට ගැනීමට හේතු මොනවා ද? (ලකුණු 04යි)

(iii) ආර්ථික ලාභය, නිෂ්පාදක අතිරික්තය සහ ස්ථාවර පිරිවැය අතර සම්බන්ධතාව කුමක් ද? (ලකුණු 03යි)

(iv) ආර්ථික බදු කුලිය යනු කුමක් ද? නිෂ්පාදන සාධකයකට ආර්ථික බදු කුලියක් උපයා ගත හැකිවනුයේ කවර තත්ත්වයන් යටතේ දී ද? (ලකුණු 04යි)

(v) පූර්ණ තරගකාරී කර්මාන්තයක ආයතනවල කෙටි කාලීන සැපයුම් වක්‍ර මගින් කර්මාන්තයේ කෙටි කාලීන සැපයුම් වක්‍රය ව්‍යුත්පන්න කරගන්නේ කෙසේ ද? යෝග්‍ය රූපසටහන් භාවිත කරමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

**5.** (i) ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඇතුළත් කරගනු ලැබේ ද නැද්ද යන්න සඳහන් කොට, ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

(a) ශ්‍රී ලාංකික සමාගමක් මගින් අලුතින් නිකුත් කරනු ලැබූ රුපියල් මිලියන 1ක කොටස් ආයෝජකයෙක් විසින් මිලදී ගැනීම.

(b) රුපියල් මිලියන 50ක් වටිනා නව නිවසක් ඉදිකිරීම.

(c) කොළඹ නගරයේ ආපනශාලාවකට රුපියල් 50 000ක මාළු ධීවරයෙකුගෙන් මිලට ගැනීම.

(d) ගොවියෙක් යාබද වනාන්තරයකින් රුපියල් 5 000ක් වටිනා මී පැණි එකතුකර ගැනීම.

(e) විශ්වවිද්‍යාලයක පර්යේෂණ කණ්ඩායමක් විසින් රුපියල් මිලියන 10ක් වැයකොට කෝවිඩ් -19 වසංගතයේ ආර්ථික ප්‍රතිවිපාක පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක් නිමකිරීම.

(ලකුණු 01 × 5 = 05යි)

(ii) කල්පිත ආර්ථිකයක් පිළිබඳ පහත සඳහන් දත්ත ඔබ වෙත ලබා දී ඇත.

| අයිතමය | වටිනාකම (රු. බිලියන) |
|---|---|
| සමාහාර පරිභෝජන වියදම | 10 000 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 4 000 |
| භාණ්ඩ හා සේවා අපනයන | 3 500 |
| භාණ්ඩ හා සේවා ආනයන | 4 500 |
| අවශේෂ ලෝකයෙන් ලැබුණු ශුද්ධ ප්‍රාථමික ආදායම | − 400 |
| අවශේෂ ලෝකයෙන් ලැබුණු ශුද්ධ ජංගම සංක්‍රාම | 1 000 |

ඉහත දත්ත පදනම් කරගනිමින් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(a) දළ ජාතික ආදායම (ලකුණු 02යි)

(b) දළ ජාතික ඉතුරුම් (ලකුණු 02යි)

Visit EDUHUB

(iii) පහත සඳහන් ආකෘතිය රජයේ කටයුතු නොමැති ආවෘත ආර්ථිකයක් නිරූපණය කරයි.

$C = 500 + 0.8Y$ $I = 600$ (සියලුම අගයන් රුපියල් බිලියනවලිනි)

(a) මෙම ආර්ථිකයේ ස්වායත්ත වියදම් ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02යි)

(b) සමාහාර නිමැවුමේ සමතුලිත අගය කොපමණ ද? (ලකුණු 02යි)

(c) ආයෝජන ගුණකයේ අගය කුමක් ද? (ලකුණු 02යි)

(iv) යෝග්‍ය රූපසටහන් භාවිත කරමින් සමාහාර වියදම් ශ්‍රිතය සහ සමාහාර ඉල්ලුම් වක්‍රය අතර වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

## 'ආ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

**6.** (i) මුදල් ප්‍රමාණවාදය යනු කුමක් ද? (ලකුණු 04යි)

(ii) උද්ධමනයෙහි පිරිවැය කවරේ ද? (ලකුණු 04යි)

(iii) මුදලට ඇති ඉල්ලුමෙහි ප්‍රධාන නිශ්චායක කවරේ ද? (ලකුණු 03යි)

(iv) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(v) යම් දෙන ලද කාල පරිච්ඡේදයක් තුළ කිසියම් ආර්ථිකයක මුළු මුදල් තොගය (M) රුපියල් බිලියන 6 400ක් ද, මහජනයා සතු මුළු බැංකු තැන්පතු (D) රුපියල් බිලියන 5 200ක් ද, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10%ක් ද, බැංකු සතු අධි සංචිත ප්‍රමාණය රුපියල් බිලියන 280ක් ද බව උපකල්පනය කරන්න.

(a) මෙම ආර්ථිකයේ මුළු අධිබල මුදල් ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 03යි)

(b) මුදල් ගුණකයේ අගය කොපමණ ද? (ලකුණු 02යි)

**7.** (i) පහත දැක්වෙන භාණ්ඩ හා සේවා ශුද්ධ පොදු භාණ්ඩ ලෙස සැලකිය හැකි ද? නොහැකි ද? යන්න සඳහන් කොට ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(a) ප්‍රදීපාගාර

(b) සාගර මසුන්

(c) අන්තර්ජාලය (ලකුණු 03යි)

(ii) ශුභ සාධන භාණ්ඩ **දෙකක්** නම් කොට ඒවා ශුභ සාධන භාණ්ඩ වශයෙන් සැලැකෙන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) 'විසර්ජන පනත' සහ 'අතුරු සම්මත ගිණුම' අතර වෙනස දක්වන්න. (ලකුණු 04යි)

(iv) මෑත වර්ෂවල දී ශ්‍රී ලංකා රජයේ බදු නොවන අයභාර මූලාශ්‍ර කවරේ ද? (ලකුණු 04යි)

(v) නිදහස් වෙළෙඳපොළක් තුළ සෘණ බාහිරතා සහිත භාණ්ඩයක් අධි නිෂ්පාදනයකට යොමුවන්නේ ඇයි? රූපසටහනක් යොදා ගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

**8.** (i) සාපේක්ෂ වාසිය සහ තරගකාරිත්ව වාසිය අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04යි)

(ii) අපනයන ඉපයුම්වල ශීඝ්‍ර වර්ධනයක් අත්කර ගැනීමෙහි ලා ශ්‍රී ලංකාව මුහුණ දෙන ප්‍රධාන බාධක කවරේ ද? (ලකුණු 05යි)

(iii) නිල සංචිත වත්කම් යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? ඒවායේ ප්‍රධාන සංරචක නම් කරන්න. (ලකුණු 05යි)

(iv) කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනයේ දී නිරපේක්ෂ වාසියකින් තොරව සාපේක්ෂ වාසියක් ඇතිවිය හැකි ද? සංඛ්‍යාත්මක උදාහරණයක් ඇසුරින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

Visit EDUHUB

**9.** (i) ආර්ථික වෘද්ධියේ ප්‍රධාන මූලාශ්‍ර සඳහන් කරන්න. (ලකුණු 04යි)

(ii) සංවර්ධනය මැනීමෙහි ලා මානව සංවර්ධන දර්ශකයෙහි දක්නට ඇති ප්‍රධාන සීමාකම් කවරේ ද? (ලකුණු 05යි)

(iii) "ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අඩුකිරීම සඳහා සමෘද්ධි වැඩ සටහනෙන් කරනු ලැබ ඇති බලපෑම නොවැදගත් සහ දුබල වූවකි." ලෝක බැංකුවේ මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න. (ලකුණු 05යි)

(iv) ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය සඳහා ඇති සමාජ ආරක්ෂණ ජාලයට ප්‍රජාවිද්‍යාත්මක වෙනස්කම් මගින් එල්ලකරනු ලැබ ඇති නව අභියෝග කවරේ දැයි විස්තර කරන්න. (ලකුණු 06යි)

**10.** (i) සිව්වන කාර්මික විප්ලවය (4IR) යනු කුමක් ද? ඒ සඳහා මුහුණ දීමට ශ්‍රී ලංකාව සූදානම් ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(ii) ශ්‍රී ලංකාව මත කෝවිඩ් -19 වසංගතය සිදුකොට ඇති ආර්ථික බලපෑම සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05යි)

(iii) "දීර්ඝ කාලයක් පුරාවට ඉහළ ආර්ථික වෘද්ධි අනුපාතිකයක් පවත්වා ගෙන යාමට ශ්‍රී ලංකාව අපොහොසත්ව සිටී." මෙම ප්‍රකාශය තහවුරු කර ශ්‍රී ලංකා ආර්ථිකයේ ඌන සාධනයට බලපා ඇති හේතු සඳහන් කරන්න. (ලකුණු 05යි)

(iv) "නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන අත්දැකීම් පැහැදිලිව පෙන්වා දෙනුයේ, ආර්ථික ප්‍රතිපත්ති තීරණය කරනු ලැබ ඇත්තේ බොහෝ දුරට කාර්යක්ෂමතාව මත පදනම්ව නොව දෘෂ්ටිවාදයන් මත පදනම්ව ය." නිදසුන් සහිතව මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

* * *

Visit EDUHUB